**මාර්ග සංවර්ධන අධිකාරිය - 2021**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නියමයන් අනුව, එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ග වල විවිධ උප කොටස් වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ක්ෂය අනුපාත සඳහා වෘත්තීමය තක්සේරුවක් ලබා ගැනීමට තීරණය කරන ලදි. | අධිවේගී මාර්ගයක් සංයුතවන විවිධ උප කොටස්වල ජීවිත කාලයන් එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය වන බැවින් එම කොටස් සුදුසු රේටයන් යටතේ ක්ෂය කලයුතු බව. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් නියමයන්ට පටහැනිව වගකීම් කාලසීමාව 2022 වර්ෂයේ හෝ ඊට පෙර අවසන් වීමට නියමිත වූ ව්‍යාපෘති 54 කට අදාළ රු.මිලියන 21.37 ක රඳවා ගැනීමේ මුදල් සහ වර්ෂයේදී පියවීමට නියමිත රු.මිලියන 659 ක ගෙවිය යුතු ණය වාරික ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි. එසේම ඉදිරි වර්ෂයේදී පියවීමට නියමිත රු.මිලියන 51.53 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. තවද අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද කි.මී 100,000 මාර්ග ව්‍යාපෘතිය යටතේ වූ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල වූ රු.මිලියන 3,671 න් සියයට 60 ක් ජංගම වගකීම් ලෙසත් ඉතිරි සියයට 40 ජංගම නොවන වගකීම් ලෙසත් එම ව්‍යාපෘතියට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වූ රු. මිලියන 13,347.5 න් පිළිවෙලින් සියයට 75 ක් හා සියයට 25 ක් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙසත් පදනමකින් තොරව බෙදා වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මින් ඉදිරියට එසේ නොවීමට වග බලා ගන්නා ලෙස අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිතය අනුව ජංගම හා ජංගම නොවන වත්කම් හා වගකීම් නිවැරදිව හඳුනා ගත යුතු බව . |

| | | |
|---|---|---|
| (ඇ) 2021 ජනවාරි 01 දින වන විට අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 394.9 ක් වූ වාහන 155 ක් හා පිරිවැය රු.මිලියන 56.6 ක් වූ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. එම වාහන හා ගොඩනැගිලි තවදුරටත් අධිකාරිය භාවිතා කරමින් පැවති නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට ද කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ප්‍රත්‍යාගණන කටයුතු ඉදිරියේදී සිදුකරනු ලැබේ. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් භාවිතා කරන්නේ නම් ප්‍රමිතය පරිදි ප්‍රත්‍යාගණනය සිදුකර පොත්වල ඇතුලත් කල යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව වත්කමක් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනිත කළ යුතුව තිබුණු , පානදුර දක්වා වූ මුහුදුබඩ මාර්ගය ඉදිකිරීම සඳහා වැයකර තිබුණු රු.මිලියන 556.8 ක් සමාලෝචිත වර්ෂයේ අයභාර වියදමක් ලෙස ආදායමෙන් කපා හැර තිබුණි. ඒ අනුව වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් ඌණ ගණනය වී තිබුණි. | අතපසුවීමකින් මෙම ව්‍යාපෘතියේ පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොමැත. | ජංගම නොවන වත්කම් සඳහා වැය කිරීම් ප්‍රාග්ධනිත කල යුතු බව . |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග කිලෝමීටර් 100,000 වැඩ සටහන යටතේ අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වැය කරන ලද රු. මිලියන 82,692 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් තව දුරටත් අධ්‍යයනය කර ඉදිරියේදී සුදුසු ගිණුම් ක්‍රමවේදයක් හදුන්වා දෙනු ලැබේ. | අධිකාරියට අදාල නොවන ප්‍රාග්ධන වියදම් දැරීමේදී ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ ප්‍රතිපත්තිය හඳුනා ගත යුතු බව . |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තොග සම්බන්ධ හෙළිදරව් කිරීමට අනුව තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම්ගත කිරීම වෙනුවට 2021 දෙසැම්බර් 31 දිනට චලනය නොවන තොග සඳහා රු.මිලියන 26.7 ක වෙන් කිරීමක් සිදුකර තිබුණි. | අතපසුවීමකින් ඒ පිළිබදව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොමැත. | තොග ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ගිණුම්ගත කල යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.මිලියන 63.6 ක් වූ අතර ඒ තුළ ඇතුළත් ලිපි ද්‍රව්‍ය නොවන අයිතම් වල වටිනාකම රු.මිලියන 5.2 ක් විය. ඒ අනුව, එදිනට වූ ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම එම වටිනාකමින්ම අධි ගණනය වී තිබුණි. | අතපසුවීමකින් සමහරක් ලිපි ද්‍රව්‍ය නොවන අයිතම්වල තොග වටිනාකම් ලිපි ද්‍රව්‍ය තොගය යටතේ පෙන්වා ඇත. | නිවැරදිව වර්ගීකරණය කර ගණනය කර තොග ගිණුම්ගත කල යුතු බව. |
| (ඇ) අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාල මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග 144 කට අයත් කිලෝමීටර් 3,179 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 9,046 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් තවදුරටත් බැහැර වී තිබෙන අතර මෙය සමස්ථ මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 74 ක් බව නිරීක්ෂණය විය. | නියමිත ක්‍රමවේදයක් 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. | අධිකාරියට අයත් වත්කම් වන ජාතික මහා මාර්ග ප්‍රාග්ධනිත කර සුදුසු පරිදි ක්ෂය කිරීමට කටයුතු කළ යුතු බව . |
| (ඈ) 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 605,646 ක්වූ අධිවේගී මාර්ග කිලෝ මීටර් 271 ක පිරිවැය රේඛීය අමාත්‍යාංශය මගින් දරා තිබූ අතර එම මුළු ඉදිකිරීමේ වටිනාකම අධිවේගී මාර්ග ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. එසේ වුවත් එම වත්කම් වලට ප්‍රාග්ධනිත කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට අදාල උපයෝගී ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීම් කර ඇති අතර මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොතිබුණි. | භාණ්ඩාගාරය සමඟ එකඟතාවයකින් යුතුව ප්‍රාග්ධනිත කල යුතු බව. |
| (ඉ) අධිකාරියේ වත්කම් ලේඛණයේ වටිනාකම සඳහන් නොවූ අධිකාරියට අයත් මෝටර් වාහන 258 ක් භෞතිකව පැවති අතර එම මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද 2022 / 2023 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන රක්ෂණය කිරීම සඳහා රු.මිලියන 492.95 ක් වැය කර තිබූ අතර එසේ රක්ෂණය කරන ලද වාහන අතරින් වාහන 54ක් අධිකාරියේ වාහන ලේඛනය තුළ ඇතුලත්ව නොතිබුණි. | යාන්ත්‍රික අංශයෙන් වත්කම් ලේඛනයට ඇතුළත් කර අවශ්‍ය ගිණුම් ගැලපුම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මෝටර් වාහන විධිමත්ව පවරාගෙන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතු බව හා අධිකාරියට අයත් වාහන පමණක් රක්ෂණය කල යුතු බව . |
| (ඊ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන කටයුතු වලදී අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා මිල දී ගෙන 2016 සහ 2017 වර්ෂවලදී ලියාපදිංචි කරන ලද රු.මිලියන 34 ක් වූ අක්කර 07 ක ඉඩම් කැබලි 04 ක් හා පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘති - II අදියර නිම කිරීමේදී ව්‍යාපතිය විසින් අධිකාරිය වෙත භාර දී | ඉඩම් කැබලි පිළිබඳ ව තොරතුරු කැඳවා ඉදිරියේදී ගිණුම් ගත කරනු ලැබේ. | අධිකාරිය සතු සියලු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු බව . |

| | | |
|---|---|---|
| තිබූ රු.මිලියන 8.2 ක් වූ ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. | | |
| (උ) ගිණුම් අංශය විසින් විගණනය වෙත ලබා දුන් උපලේඛණ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අංශය විසින් හා ව්‍යාපෘති සඳහා අත්කරගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි හා ඊට අදාළ පොළිය රු.මිලියන 585.19 ක් වුවද, ඉඩම් අංශය විසින් මේ සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඊට අනුරූපී ගෙවිය යුතු වන්දි හා පොළිය රු.මිලියන 958 ක් විය. ඉඩම් වන්දි හා පොලී උපචිත වියදම් පදනම මත ගණනය නොකිරීම මේ සඳහා හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වූවත්, එම ශේෂයන්ගේ වෙනසට හේතු සමාලෝචනය කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. | ඉඩම් වන්දි හා පොලී සඳහා උපචිත වියදම් ගණනය කිරීම ප්‍රායෝගික වශයෙන් තොරතුරු ලබා ගැනීමට ඇති දුෂ්කරතා මත සිදු කිරීමට අපොහොසත් වී ඇත. | ඉඩම් වන්දි හා පොලී සඳහා උපචිත වියදම් පදනම මත ගණනය කිරීම් කර ගිණුම් තැබීම කළ යුතු බව |
| (ඌ) ඉඩම් අත්කර ගැනීමේ නිතිරීති හා රෙගුලාසි අනුව අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවීමට බැඳී සිටින සම්පූර්ණ ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවකට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට එලෙස ගිණුම්ගත නොකළ ගෙවිය යුතු පොළිය රු.මිලියන 307.07 ක් බව නිරීක්ෂණය විය. | මෙම තත්වය නිවැරදි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගෙවීමට බැඳී සිටින වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව - II ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාලව ගෙවිය යුතු වන්දි හා පොළිය ලෙස 2020 වර්ෂයේ වෙන්කර තිබුණු රු.මිලියන 135.8 ක මුදල 2021 වර්ෂය තුළ ගෙවීම් කිරීමේ දී නැවත වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සහ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමට අදාළව ගෙවිය යුතු පොලී රු. මිලියන 308.92 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පොළී වියදම් රු.මිලියන 444.72 වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුනි. | රටේ පවතින වර්තමාන අර්බුදකාරී තත්වය මත මෙම ලේඛන නියමිත දිනට ඉදිරිපත් කිරීමට අතපසු විය. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. |
| (ඒ) විදේශාධාර ව්‍යාපෘති වලින් සහ වෙනත් ක්‍රම වලින් අධිකාරියට ලැබී තිබුණු එකතුව රු.මිලියන 1,400.15 ක් වූ තොරතුරු පද්ධතීන් හා පිරිවැය රු.මිලියන 3,958 ක් වූ පාලම් හා ලී බඩු උපකරණ යනාදී ස්ථාවර වත්කම් අධිකාරියේ ගිණුම් වලට ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු අදාල අංශයන්ගෙන් ලබා ගෙන ඉදිරියේදී ගිණුම්ගත කරනු ලැබේ. | විදේශාධාර ව්‍යාපෘති වලින් සහ වෙනත් ක්‍රම වලින් අධිකාරියට ලැබෙන සියලු වත්කම්වල නිවැරදි වටිනාකම් ගණනය කර ගිණුම්ගත කළ යුතු බව. |
| (ඔ) සමාලෝචිත වර්ෂය තුළ දුර්වල පාලම් නැවත ඉදිකිරීම් වෙනුවෙන් වැයකර තිබුණු රු.මිලියන | පිරිවැය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඉදිරියේදී | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ඒ අනුව |

| | | |
|---|---|---|
| 362.11 ක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පිරිවැය සංවර්ධන හා නඩත්තු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට හෝ වියදමක් ලෙස කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් තැබිය යුතුවේ. |

### 1.5.4 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මි) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මි) | වෙනස (රු.මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරිය සහ සී/ස මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම අතර වූ ජංගම ගිණුම් අතර වෙනස. | 13,953 | 16,221 | 2,268 | මෙම වෙනසට හේතු වූ කරුණු පිළිබඳව සහ තොරතුරු කැඳවීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | අදාළ සැසඳීම් කාලීනව සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉටුකලයුතු සේවාදායක තැන්පතු ශේෂය සහ එයින් නිරූපණය කෙරුණු වත්කම් අතර වූ වෙනස. | 3,070.9 | 4,801.6 | 1,730.7 | නිසි අධ්‍යයනයකින් පසුව සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අදාළ සැසඳීම් කාලීනව සිදු කළ යුතුය |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.මිලියන 529 ක් වූ ගොඩනැගිලි සහ වෙනත් වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, එම වත්කම් හඳුනා ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ස්ථාවර වත්කම් ලේඛණය, වත්කම් භාවිත කරන පාර්ශ්වය. | තක්සේරු වාර්තා ලද පසු ස්ථාවර වත්කම් ලේඛණ යාවත් කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් සියලු ජංගම නොවන වත්කම් ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කල යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012/13 වර්ෂවල එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දකුණු පළාත තුළ ඉටු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ආයෝජන මණ්ඩලය වෙතින් පිළිවෙලින් ලැබිය යුතු රු.මිලියන 306 ක්, රු.මිලියන 124 | අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබයි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටි අඛණ්ඩව ක්‍රියාත්මක කර මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |

ක් තවදුරටත් අය වී නොතිබුණි.

| | | |
|---|---|---|
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියට අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයෙන් වසර 02 ත්, වසර 05 ත් අතර ශේෂය රු.මිලියන 53.25 ක් හා වසර 05 ඉක්මවා ඇති ශේෂය රු.මිලියන 58.11 ක් විය. | පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටි අඛණ්ඩව ක්‍රියාත්මක කර මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු බව. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අංශයේ විසින් මග නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම හා මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු රඳවුම් මුදලින් වසර 5 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින මුදල රු. මිලියන 687.9 ක් ද වසර 4-5 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පවතින මුදල රු. මිලියන 126.7 ක්ද විය. | මුදල් අග්‍රීමය ලැබුනු පසු ගෙවීමට කටයුතු කරන අතර ඉතිරිය ගෙවීම සඳහා වවුචරපත් ඉදිරිපත් කරන ලෙස පළාත්භාර අධ්‍යක්ෂවරු වෙත දන්වන ලදි. | ගෙවීම් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ 2021 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් වටිනාකම රු.බිලියන 356.44 ක් වූ මාර්ග ව්‍යාපෘති 11,595 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම් අවසන්ව තිබුණි. එදිනට මෙම වැඩසටහන වෙනුවෙන් රු.බිලියන 92.25 ක් වැය කර තිබූ අතර, රු.බිලියන 15.65 ක බිල්පත් සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. 2022 ඔක්තෝබර් 31 දිනට නොපියවා තිබූ බිල්පත් වටිනාකම රු.බිලියන 52.5 ක් වූ අතර මෙයින් රු.බිලියන 25.49ක් මාස 3 ක් ඉක්මවා තිබුණි. | කි.මී 100,000 ව්‍යාපෘතියේ අරමුදල් මුලාශ්‍රයන් වන්නේ දේශීය බැංකු හා රාජ්‍ය භාණ්ඩාගාරය වේ. එබැවින් එම මුලාශ්‍ර මගින් අරමුදල් ව්‍යාපෘතියට ප්‍රේෂණය කිරීම අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් හට ගෙවීම් සිදුකරනු ලබයි. | අදාළ ශේෂයන් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | වර්ෂ 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර සේවය අවසන් කරන ලද නිලධාරීන්ට හිමි පාරිතෝෂික දීමනාව ඔවුන් සේවයෙන් ඉවත් වූ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, 2021 වර්ෂය තුළ සේවයෙන් විශ්‍රාම ගිය, ඉල්ලා අස්වූ, මියගිය සහ තනතුර අතහැර ගිය නිලධාරීන් 32 දෙනෙකු සඳහා 2021 වර්ෂය තුළ දී පාරිතෝෂික ගෙවීම් සිදු කර නොතිබුණි. එසේ ප්‍රමාද කාලය පදනම් කරගෙන පොළී මුදලක්ද ගෙවිය යුතුවේ. | දින 30 ක් තුල ගෙවිය යුතු බවට එකග වේ. | පාරිතෝෂික පනත ප්‍රකාරව අදාළ ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 වන වගන්තිය හා 5 වන වගන්තිය | අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. තවද, කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්යසාධන ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරවනු ලැබේ. | චක්‍රලේඛනයේ විධිවිධාන අනුව ක්‍රියාකල යුතුය. |
| (ඇ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 සහ 2009 ජුනි 01 දිනැති අංක 30(I) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය: | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම වෙනුවට එකී නියමයන් නොසලකා හැර අධ්‍යක්ෂ මණ්ඩල තීරණමත තනතුරු 23 කට අදාල නිළධාරීන් 287 ක් සඳහා වැරදි වැටුප් පරිමාණයන් අනුව වැටුප් සකස්කර ඒ අනුව ගෙවීම්කර තිබුණි. | සම්පූරණයෙන්ම එකග වේ. | චක්‍රලේඛනයේ විධිවිධාන හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ක්‍රියාකල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය | අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් සකස්කළ යුතු වුවද එපරිදි සැලසුම් සකස් කර නොතිබුණි. | මේ සකස්කර වන විට ක්‍රියාත්මක කර ඇත. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |
| (ඉ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය. | ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි. | අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම ආරම්භ කර ඇත. | කොන්ත්‍රාත් හා සැපයුම්කරුවන් පිළිබඳ දත්ත සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |
| (ඊ)මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 ජූනි 10 දිනැති අංක RDA/GM/10/169 දරණ චක්‍රලේඛය. | ප්‍රවාහන පහසුකම් සලසාදීමේදී කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධවන ඉංජිනේරුවරයාට ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණද, ඊට අනුකූල නොවී කොන්ත්‍රාත් සඳහා සෘජු සම්බන්ධතාවයක් නොදැක්වූ මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලවල ඉංජිනේරුවරුන් සහ කාර්මික නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට වෑන් රථ, කැබ් රථ හා කාර් රථ කුලියට ලබාගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් එකතුව රු.මිලියන 23.3 ක කුලී ගෙවා තිබුණි. | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුවන් මෙන්ම, තාක්ෂණික/කාර්මික නිලධාරීන්ගේද සෘජු සේවා අවශ්‍යතාවයක් තිබූ බැවින් හා එකවර ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන බැවින් හා කොවිඩ් වසංගත තත්ත්වය පැවති කාලය තුළදී සේවක මහත්ම මහත්මීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණ වලට අනුව සිදුකරන ලදී. | චක්‍රලේඛනයේ විධිවිධාන අනුව කොන්ත්‍රාත්තුවට සෘජුව සම්බන්ධ ඉංජිනේරුවරයාට පමණක් ප්‍රවාහන පහසුකම් සලසා දිය යුතු බව. |
| (උ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3), 6(1) සහ 7(1) වගන්ති | වගන්ති ප්‍රකාරව පිළිවෙලින් "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම"සකස්කර නොතිබූ අතර "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" සහ "දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු" පිහිටුවා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මඟින් මේ පිළිබඳව කටයුතු කරමින් පවතී. | පනතේ අදාළ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු බව. |
| (ඌ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි | ගාස්තු අයකරන ජාතික මහාමාර්ග වලින් ලැබෙන මුදල් අධිකාරියේ අරමුදලට බැරකල යුතු වේ. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ | අධිවේගී මාර්ග වලින් ලැබෙන ආදායම මහා භාණ්ඩාගාරයේ අවසරය ඇතිව වැටුප් | පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය | දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග වලින් එකතු කරගත් රු.මිලියන 61,435 ක ආදායමෙන්, අධිකාරියේ සියලු ආදායම් ප්‍රභව මත බදු ගෙවීම සඳහා රු. මිලියන 18,473 ක් වැයකර තිබුණි. තවද ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර ව අධිකාරියේ සේවකයන් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.මිලියන 10,713 ක් ද පොදු වියදම් හා ව්‍යාපෘති වලට ගෙවීම් සඳහා රු.මිලියන 3,402.3 ක් සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 650 කට අධික මුදලක් වැයකර තිබුණි. | ගෙවීමේදී ඇති වන අරමුදල් ඌණතාවය සඳහා භාවිතා කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමස්ත මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 86,181.42 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 183,437.38 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 97,255.96 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ව්‍යාපෘති වැඩ නිම කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිවල වත්කම් ප්‍රාග්ධනිත කිරීමට අදාලව ලද ප්‍රාග්ධන ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 140,604කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ නමුත් නඩත්තු හා වැඩිදියුණු කිරීම් සඳහා රේඛීය හා රාජ්‍ය අමාත්‍යාංශය හරහා ලද ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 39,221කින් ඉහල ගොස් තිබුණි.තවද මාර්ග කි.මී 100,000 වැඩසටහනට අදාලව අධිකාරියට අයත් නොවූ මාර්ග ඉදිකිරීම් නිමකොට ගිණුම්වලින් ලියාහැරීම නිසා සංවර්ධන හා නඩත්තු වියදම් රු.මිලියන 2,912 කින් ඉහල යාමද මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට හේතුවක් වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | 2020 | 2021 | වෙනස | අනුරූපී වසරට සාපේක්ෂව වෙනස් වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්ථන ප්‍රදාන | 36,482 | 83,848 | 47,366 | 130 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 222,876 | 82,272 | -140,604 | (63) |
| අධිවේගී මාර්ග ආදායම් | 3,760 | 4,530 | 770 | 20 |
| සංවර්ධන හා නඩත්තු වියදම් | 10,110.48 | 12,681.15 | 2,570.67 | 25 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. නඩත්තු හා වැඩිදියුණු කිරීම් සඳහා රේඛීය හා රාජ්‍ය අමාත්‍යාංශ හරහා ලද ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 39,221 කින් ඉහල ගොස් තිබීම පුනරාවර්තන ප්‍රදාන සියයට 130 කින් ඉහල යාමට ප්‍රධාන හේතුව වී තිබුණි.

ii. ව්‍යාපෘති වැඩ නිම කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිවල වත්කම් ප්‍රාග්ධනිත කිරීමට ලද ප්‍රාග්ධන ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 140,604 කින් අඩුවීම ප්‍රාග්ධන ප්‍රදාන සියයට 63 කින් අඩුවීම කෙරෙහි හේතු වී තිබුණි.

iii. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේ පැවති දැඩි සංචරණ සීමා ලිහිල් වීම හේතුවෙන් අධිවේගී මාර්ග භාවිතය සාපේක්ෂව ඉහල යාම අධිවේගී මාර්ග ආදායම සියයට 20 කින් ඉහල යාමට හේතු වී තිබුණි.

iv. මාර්ග කි.මී 100,000 වැඩසටහනට අදාලව අධිකාරියට අයත් නොවූ මාර්ග ඉදිකිරීම් නිමකොට ගිණුම්වලින් ලියාහැරීම නිසා සංවර්ධන හා නඩත්තු වියදම් රු.මිලියන 2,912 කින් ඉහල යාම සංවර්ධන හා නඩත්තු වියදම් සියයට 25 කින් ඉහල යාමට මූලිකව හේතු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2021 දෙසැම්බර් 31 දිනට | 2020 දෙසැම්බර් 31 දිනට | පෙර වසරට සාපේක්ෂව වෙනස් වීම යහපත් ද අයහපත් ද යන වග |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 1.41 | 1.20 | යහපත්ය |
| ක්ෂණික අනුපාතය | 1.38 | 1.18 | යහපත්ය |
| ශුද්ධ ලාභ අනුපාතය | 49 | 68 | අයහපත්ය |
| ණය ස්කන්ධ අනුපාතය | 0.47 | 0.42 | අයහපත්ය |
| මුළු ණය- මුළු වත්කම් අනුපාතය(සියයට) | 30.81 | 28.72 | අයහපත්ය |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිගත් අවම මට්ටමේ පැවති අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එකී අනුපාතයන් වල ධනාත්මක වැඩිවීමක්ද නිරූපනය විය.

ii. පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිගුකාලීන ණය සියයට 24කින් ඉහල යනවිට එදිනට අධිකාරියේ ස්කන්ධය සියයට 12කින් පමණක් ඉහල යාම තෝලන අනුපාත පෙර වසරට සාපේක්ෂව අයහපත් වීම කෙරෙහි බලපා තිබුණි.
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 359,479 ක් වූ අතර එය රු.මිලියන 268,313 ක බැංකු ණය වලින් හා රු.මිලියන 91,166ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට පොළිය නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංවර්ධනයේදී එකී ආයතනය විසින් ඉඩ නොදෙන වියදම් ඇතුළත් කිරීම, අසාමාන්‍ය ප්‍රමාණයකින් සාමාන්‍ය අපතයන් ඇතුළත් කිරීම, තෝරාගෙන තිබූ මිල අනුපාතයන් දෝෂ සහගත වීම, අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව වියදම් ඇස්තමේන්තු කිරීම සහ අවශ්‍යතාවය සපුරාගත හැකි ප්‍රශස්ත ක්‍රමය තෝරා නොගැනීම වැනි හේතූන් නිසා මාතර, පොළොන්නරුව, මහනුවර සහ නුවර එළිය දිස්ත්‍රික්ක වලට අයත් මාර්ග කිහිපයක ඇස්තමේන්තු රු.මිලියන 326.2 කින් අධිගණනය වී තිබුණි. මෙලෙස වැරදි ඇස්තමේන්තු මත පදනම්ව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීම නිසා රු.මිලියන 61 ක් වැඩිපුර ගෙවා | මෙම පරීක්ෂාවට ලක්කරනු ලැබූ ව්‍යාපෘතීන් වලට අදාල අවසන් ගෙවීම් මේ දක්වා සිදුවී නොමැති අතර එකවර ගෙවීම් කොන්ත්‍රාත් ක්‍රමවේදය තුල ගෙවීමට ප්‍රථම ඇස්තමේන්තුව සංශෝධනය විය යුතුය. දැනට එම ඇස්තමේන්තු සංශෝධනය කිරීම කරගෙන යනු ලබයි. | ඇස්තමේන්තු පිළියෙල කිරීම වඩාත් නිවැරදිව විධිමත් අධීක්ෂණයක් යටතේ සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ අවස්ථා කිහිපයක් විගණනයේදී නිරීක්ෂණය විය. එසේම, ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයයන් නිසි පරිදි ඉටු නොකිරීම සහ නියමිත ප්‍රමිතියෙන් තොරව ABC සහ ඇස්පෝල්ට් ඇතිරීම වැනි තත්වයන් තිබියදී මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 14.2 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා 2014 දෙසැම්බර් 18 දින මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා බැංකුව සමඟ එළඹි ගිවිසුමේ ගිවිසුම්ගත කාලය 2020 ජුනි 08 දිනෙන් අවසන් වී තිබුණ ද, නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. එසේම, මෙම අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීමට අයකරන ගාස්තු වලින් සියයට 10 ක වට්ටමක් ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමයට මාරු වන මුල් මාස 06 ක කාලයක් දක්වා පමණක් එම භාවිතකරුවන්ට ලබා දීමට අවසර ලබා දී තිබුණි. මාස 06 ඉකුත් වීමෙන් පසු ද මෙම සියයට 10 වට්ටම ලබා දීම හේතුවෙන් 2021 සහ 2020 වර්ෂ වලට අදාළව පිළිවෙළින් රු.මිලියන 29 ක් සහ රු. මිලියන 27 ක් වශයෙන් එකතුව රු.මිලියන 56 ක් අධිකාරියට අහිමිව තිබුණි. තවද, දෛනිකව එකතු වන ඉලෙක්ට්‍රොනික ගාස්තු අධිකාරියේ ආදායම් රැස්කිරීමේ ගිණුමට ප්‍රේෂණය වීමේ කාල ප්‍රමාදයක් ද පැවතුණි. | ගැටළු නිවැරදි කිරීමට තාක්ෂණික කණ්ඩායම් සැමවිටම උපරිම උත්සාහයක් දරයි. | විධිමත් හා යාවත්කාලීන ක්‍රමවේදයන් අනුව ගාස්තු අයකිරීම කල යුතුවේ. |
| (ඇ) | දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ සකස්කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා නිවැරදි කිරීම සිදුකරන ලෙස සියලු පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවරු හා විධායක ඉංජිනේරුවරු වෙත අදාල ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් දන්වා තිබුණද, 2022 ඔක්තෝබර් 30 දින වනවිටත් එකතුව රු.මිලියන 15,690. 5 ක් වටිනා ව්‍යාපෘති 146 ක් සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් සිදුකර නොතිබූ අතර ඒ අනුව අනාගතයේදී කොන්ත්‍රාත්කරුවන්ට සම්මත අනුපාතයට වඩා වැඩි මිල අනුපාතයක් ගෙවීමෙන් රජයට මූල්‍ය පාඩුවක් සිදුවීමට අවස්ථා පවතින බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ ගෙවීම් නිර්දේශ කිරීම එකඟ වූ කොන්ත්‍රාත් මුදල ව්‍යාපෘතියේ ප්‍රගතිය සමග ගණනය කරනු ලබන සන්ධිස්ථාන ප්‍රතිශතයක් ලෙස නිර්දේශ කරනු ලබයි. මෙම වැඩ කර ගෙන යනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම් සංශෝධනයන් , මහාමාර්ග අමාත්‍යාංශයේදී විගණන අංශ සමග සිදු කරනු ලැබූ සාකච්ඡාවේදී ඇතිකර ගත් එකඟතාවයන් මත ඉහත ක්‍රමවේදය තුළ අවසන් ගෙවීමට ප්‍රථමව සිදු කරනු ලබයි. | ඇස්තමේන්තු පිළියෙල කිරීම විධිමත්, ආර්ථික වශයෙන් ඵලදායි හා වගකීම් සහගත ලෙස සිදුකල යුතු අතර ඒ පිළිබඳව සුපරීක්ෂණයක්ද සිදුකල යුතු බව. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් අධිවේගී මාර්ග ප්‍රවාහන සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | මූල්‍ය ප්‍රකාශන නියමිත කාල රාමුව තුළ විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | අධිකාරිය සතු පරිපාලිත සමාගම් අතුරින් මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2017 වර්ෂයේ සිට විගණන මතය ව්‍යාවනය වෙමින් පවතින අතර, මහ නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමේ 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා විගණන මතය ද ව්‍යාවනය විය. | පිළිතුරු ලබා දී නැත | පරිපාලිත සමාගම්වල කටයුතු මනාව අධීක්ෂණය කළ යුතු බව. |
| (ඇ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය ප්‍රකාරව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක්ම කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියලු සමාගම් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල සමාගම් දැනුවත් කර ඇත. | පරිපාලිත සමාගම්වල කටයුතු මනාව අධීක්ෂණය කළ යුතු බව. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට හේතු දැක්වීමකින් තොරව රඳවා ගැනීම් රු.මිලියන 3,360.9 ක් වූ අතර රු. මිලියන 99.4 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවා ගෙන තිබුණි. මාර්ගවල ඉදිකිරීම් ප්‍රමිතිය පිළිබඳ නැවත සමාලෝචනය කර විධිමත් පටිපාටි අනුගමනය කර මෙම ශේෂ ආදායමට ගැනීමට ක්‍රියාකල යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් වලින් අදායමට ගැනීමට යෝජනා කරන ලද වටිනාකම රු.මිලියන 81.8 ක් පමණක් වී තිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරුවන්ද දැනුවත් කර අදාල රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට හෝ කමිටු නිර්දේශ මත ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ආදායමට ගත හැකි සියලු රඳවා ගැනීමේ මුදල් ආදායමට ගැනීමටත් ඉල්ලුම් නොකරන ලද මුදල් වලට අදාළ ඉදිකිරීම් ප්‍රමිති යළි සමාලෝචනයටත් ක්‍රියාකළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදලින් ඉදිකිරීම් අංශය, පළාත් අධ්‍යක්ෂ කාර්යාල හා ගෙවීම් අංශයට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගම් 04 කට අදාළව දෝෂ වගකීම් කාලය ද ඉක්මවා ඇති නමුත් නොගෙවා තිබූ රඳවා ගැනීම් මුදල රු.මිලියන 95 ක් විය. මේ සම්බන්ධයෙන් නිසි විමර්ශණයක් කිරීමෙන් අනතුරුව ආදායමට ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | අදාළ කොන්ත්‍රාත්කරුවන්ද දැනුවත් කර රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට හෝ කමිටු නිර්දේශ මත ආදායමට බැර කර ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධව නිසි විමර්ෂණයක් සිදු කොට ආදායමට ගැනීමට ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) 2021 දෙසැම්බර් 31 දිනට කළ වැඩ වටිනාකම රු.මිලියන 1,142.81ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 1,217.19 ක් ගෙවා තිබීම නිසා කල වැඩ වටිනාකම ඉක්මවා කලින් ගෙවා තිබූ මුදල රු.මිලියන 167.92 කි. කිසිදු ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතීන් සඳහා නිදහස්කර තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ද මේ අතර විය. | ව්‍යාපෘති වල වැඩ වටිනාකම ඉක්මවා ගෙවා ඇති මුදල ලෙස සටහන්ව ඇත්තේ පූර්ණ වශයෙන් අත්තිකාරම් මුදල් ආපසු අයකර ගෙන නොමැති අවස්ථාවන් වලදීය. | කිසිදු ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතීන් සඳහා නිදහස්කර තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කාර්යසාධන ඇපකර මගින් ආපසු අය කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය බැංකු අරමුදල් සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජාතික, ප්‍රාදේශිය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනයේ දී මහා මාර්ග සංවර්ධනය සඳහා භාවිතා කරනු ලබන මහා මාර්ග රේට උපලේඛනයන් (HSR) සහ පිරිවිතරයන් භාවිතා කර තිබීම ආර්ථික සහ ඵලදායී නොවන බව නිරීක්ෂණය වූ බැවින් ග්‍රාමීය මාර්ග සඳහාම වූ පිරිවිතරයන් සකස් කර අනුගමනය කළ යුතුව තිබුණි. | සියළු මාර්ග සඳහා වන මාර්ග සකස් කිරීමේ ක්‍රමයන් සමාන වන බැවින්, පොදු වශයෙන් ව්‍යාපෘති පිරිවිතරයන් භාවිතා කිරීම යෝග්‍ය වේ. | ආර්ථික වශයෙන් වඩා ඵලදායි වන බැවින් ග්‍රාමිය මාර්ග සඳහා සුදුසු වන වෙනම පිරිවිතරයක් සකස් කළ යුතු බව. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකමක් අධිකාරියට තිබෙන බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ තුළ හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම සමාගමේ රු. 1,000,100 ක කොටස් අධිකාරිය මිලට ගෙන ඇති බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල සඳහාන් වූවද, ඊට අනුරූපීව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල අධිකාරියට අයත් කොටස් වටිනාකම රු. 100 ක් පමණක් බව දක්වා රු. මිලියන 01 ක මුදල අධිකාරිය විසින් සාමාගම වෙත ලබාදුන් ණයක් ලෙස මතභේදයට තුඩු දෙන අයුරින් පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණි. කෙසේ වූවත්, මෙම කොටස් අයිතිය පිළිබඳ වූ ව්‍යාකූල තත්ත්වය නිරාකරණය කර ගැනීමට අධිකාරිය මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොටස් සහතික කිහිපවතාවක් ඉල්ලා සිටිය ද මෙතෙක් එම සහතික අධිකාරිය වෙත ලැබී නොමැත. | මෙම කොටස් අයිතිය පිළිබඳ වූ නොඑකඟතාවය කඩිනමින් නිරාකරණය කර ගත යුතු අතර, පවතින නිවැරදි තත්ත්වය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් කටයුතු කළ යුතු බව. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම යටතේ රු. මිලියන 36,349 ක පමණ ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත කොන්ත්‍රාත් වැඩ 239 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ අතුරින් කොන්ත්‍රාත් 24 ක පමණක් 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර එය මුළු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් සියයට 10 ක් පමණක් වේ. තවත් කොන්ත්‍රාත් 38 ක් කෙරීගෙන යන තත්වයේ පැවති අතර එක් කොන්ත්‍රාත්තුවක් අරමුදල් නොමැති නිසා අතරමග නතර කර තිබුණි. තවත් කොන්ත්‍රාත් 32 ක් ප්‍රතිපාදන නොමැති වීම නිසා ප්‍රදානය කර නොතිබුණි. | 2022-05-31 දිනට ව්‍යාපෘතීන්හි ප්‍රගතිය වේ. | සැලසුම් කළ කොන්ත්‍රාත් අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට අවශ්‍ය උපරිම ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 26 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් ඉක්මවා ගොස් තිබූ අතර එකී කොන්ත්‍රාත් වල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන්ගේ වලංගු කාලය ද ඉක්මවා ගොස් තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් වලින් තවදුරටත් අයවිය යුතුව තිබූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 11.93 ක් විය. ඉහත කොන්ත්‍රාත් වලට අදාළ අත්තිකාරම් සුරක්ෂණ වල වලංගු කාලය දීර්ඝ කර ගැනීමට හෝ අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර ගැනීමට හෝ කළමනාකරණය කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ වර්තමාන තත්වය දක්වා ඇත. | සැලසුම් කළ කොන්ත්‍රාත් අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර, එසේ නොවේ නම් අත්තිකාරම් සුරක්ෂණවල කාලය දීර්ඝ කර ගැනීමට පියවර ගත යුතු වේ. ඉලක්කගත දිනවල වැඩ අවසන් නොකරයි නම් අත්තිකාරම් සුරක්ෂණ කාලීනව අයකරගෙන පාඩුව අවම කර ගත යුතු වේ. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු කැඳවීමේ ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොමැති උප කොන්ත්‍රාත් සඳහා ඉඩදීම නීත්‍යානුකූල නොවූව ද, රු.මිලියන 165.9 ක වටිනාකමක් මත ගිවිසුම්ගතව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වෙනත් පුද්ගලික සමාගමක් වෙත උප කොන්ත්‍රාත් දී තිබුණි. | සේවා සපයන්නන්ගේ දායකත්වය සහිතව සංවර්ධන කටයුතු සිදුකරගෙන යනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ මාර්ගෝපදේශයන් පිළිපැදිය යුතු බව. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කි.මී 100,000 විකල්ප මාර්ග පුනරුත්ථාපන වැඩසටහන යටතේ කාර්යසාධනක් නොමැතිව කොන්ත්‍රාත්කරුවන් 11 දෙනකු විසින් අතහැර දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 18 ක් වූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 593.88 ක් විය. එම කොන්ත්‍රාත් අතුරින් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 147.45 ක් වූ කොන්ත්‍රාත් 04 ක් උක්ත කොන්ත්‍රාත්කරුවන් විසින් ආරම්භ කර නොතිබුණි. අපේක්ෂිත කාර්යසාධනයක් පෙන්නුම් නොකරන කොන්ත්‍රාත්කරුවන්ව අසාධු ලේඛනගත කිරීම සඳහා අවශ්‍ය කරන නෛතික රාමුවක් සකස් කිරීමට කළමනාකරණ අවධාණය යොමුව නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ කොන්ත්‍රාත්කරුවන් සඳහා ඉන්පසු කොන්ත්‍රාත් ප්‍රදානය සිදුනොකිරීමට වග බලාගත් අතර එවන් කොන්ත්‍රාත්කරුවන්ගේ අසාධු ලේඛනයක් සකස් කිරීමටද පියවරගෙන ඇත. | අපේක්ෂිත කාර්යසාධනයක් පෙන්නුම් නොකරන කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛනගත කළ යුතු බව. |
| (ආ) | මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක රු. මිලියන 234.7 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත ව්‍යාපෘතියක, ව්‍යාපෘති කාලය අවසන් වී දින 290 ක් ඉක්මවා තිබුණද, කොන්ත්‍රාත්තුවෙන් සියයට 76.58 ක් තවදුරටත් ඉටුකිරීමට ඉතිරිව ඇති බැවින් ඒ වෙනුවෙන් ප්‍රමාද හා දඩ අයකර ගතයුතුව තිබුණි. | කොවිඩ් වසංගත තත්වයෙන් ප්‍රමාද වීම,ආනයනික ද්‍රව්‍ය සඳහා සීමා පැනවීම හා මූලික ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම බලපෑ අතර මෙම ව්‍යාපෘතියට අදාලව කාලය දීර්ඝ කිරීම සඳහාද කොන්ත්‍රාත් සමාගම ඉල්ලීමක් ඉදිරිපත් කර දැනට අධ්‍යනය කරමින් පවතී. | කොන්ත්‍රාත් වැඩ අප්‍රමාදව ඉටු කර ගත යුතු අතර, ප්‍රමාද වන ව්‍යාපෘති වලින් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට ක්‍රියකළ යුතු බව. |

## 3.8 වෙනත් සංවිධානවලට මුදාහැරී සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 122 ක් වූ වාහන 44 ක් සහ කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන 15 ක් වශයෙන් වාහන 59 ක් පිළිවෙලින් මහා මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. | ඒ සම්බන්ධ තොරතුරු ඉදිරිපත්කර ඇත. | අධිකාරිය සතු සම්පත් වෙනත් ආයතන වලට මුදා නොහැරිය යුතු බව. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිකාරියේ මුලස්ථාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 72,400 ක ප්‍රමාණයක් මාර්ග අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය භාවිතා කරන අතර ඊට අදාළ වාර්ෂික ක්ෂය රු.මිලියන 11.87 ක් හා විදුලිය, ජලය, දූරකථන, ආරක්ෂක වියදම් හා ඉන්ධන වියදම් ඇතුළු පොදුකාර්ය වියදම්ද අධිකාරිය විසින් දරා තිබුණි. | මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සමඟ තවදුරටත් සාකච්ඡා කර සුදුසු පියවර ඉදිරියේදී ගනු ලැබේ. | පොදු කාර්ය වැය උචිත පදනමක් යටතේ අදාළ ආයතන වලින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය විසින් වාහන 49 ක් අධිවේගී මාර්ග පොලිස් කොට්ඨාශයට ලබා දී තිබූ අතර ඒ සඳහා දරණ ලද වියදම රු.මිලියන 185.5 ක් වී තිබුණි. | අධිකාරිය විසින් කුලී ගාස්තු වශයෙන් දරා ඇති රු. මිලියන 189.5 අතුරින් රු. මිලියන 185.5 ක් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයන් වෙනුවෙන් දරා ඇත. | අධිවේගී මාර්ග පොලිස් මෙහෙයුම් වියදම් පිළිබඳ විධිමත් ප්‍රතිපත්තියක් පොලිස් දෙපාර්තමේන්තුව සමඟ එකඟතාවයකින් යුතුව සකස් කර ගත යුතු බව. |

### 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 11,277 ක් වූ අතර සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 1,044 ක් ද, නිළධාරීන් 630 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවතුණි. මෙයින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 26 ක පුරප්පාඩු පැවති අතර, තනතුරු 04 ක අතිරික්තයන් ද පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අධිකාරියේ මානව සම්පත් ඵලදායීව උපයෝජනය කළ යුතු බව.. |
| (ආ) 2021 වර්ෂයේ සේවක වැටුප් හා වේතන වෙනුවෙන් අධිකාරිය දරා තිබූ සමස්ථ වියදම රු.මිලියන 11,877 ක් වූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන වලට අමතරව රු.මිලියන 4,129 ක් අධිකාරියේ අරමුදල් වලින් වැටුප් හා වේතන සඳහා වැය කර තිබුණි. | අධිවේගී මාර්ග සේවකයින්ගේ වැටුප් ගෙවීම හා ආශ්‍රිත වියදම සඳහා මිලියන 1,839.89 ක් අධිවේගී මාර්ග ආදායම යොදාගෙන ගෙවීම් කර ඇති අතර, ආයෝජන පොළී ආදායම මිලියන 699.75 භාවිතා කර ඇත.වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ඉතිරි මුදල් අධිකාරිය විසින් උපයන ලද අනෙකුත් ආදායම් තුලින් ලබා ගෙන ඇත. | විධිමත් අනුමැතියක් යටතේ අමතර වියදම් සිදු කළ යුතු බව |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය විසින් බඳවාගැනීමේ පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පවතින විවිධ සංශෝධන හේතුවෙන් මෙතෙක් බඳවා ගැනීමේ පරිපාටීන් අනුමත කර නැත. | විධිමත් හා ඵලදායි ලෙස මානව සම්පත් උපයෝජනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කල යුතු බව . |